**සී/ස තරුණ සේවා (පුද්) සමාගම - 2015 /2016**

---

සී/ස තරුණ සේවා (පුද්) සමාගමේ 2016 මාර්තු 31 දිනට මුල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 මාර්තු 31 දිනට සී/ස තරුණ සේවා (පුද්) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01**

-----------------------------------

(i) ප්‍රමිතයෙහි 32 ඡේදයට අනුව, ආයතනය විසින් වත්කම්වලට එරෙහිව වගකීම් කපා හැරීම නොකළ යුතු වුවත්, ජාතික තරුණ සේවා සභාවෙන් ලැබිය යුතු ණය ශේෂයකට එරෙහිව වටිනාකම රු. 150,000 ක් වූ දිගුකාලීන නිස්කෝ ණය මුදල කපාහැර මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ii) ප්‍රමිතයෙහි 138 ඡේදය ප්‍රකාරව, සමාගම ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය, සමාගමෙහි ව්‍යාපාර කටයුතුවල ස්වභාවය, මව් සමාගමෙහි නම සහ සමාගමෙහි ජීවිත කාලය පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

-----------------------------------

ස්ථාවර වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් රු. 6,879,936 ක් වූ වත්කම් 19 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19**

-----------------------------------

ප්‍රමිතයෙහි ඡේද අංක 139, 140 හා 141 ප්‍රකාරව, සමාගම විසින් ක්‍රියාත්මක කරන සේවක ප්‍රතිලාභ වැඩසටහන් පිළිබඳ අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි.

(ඈ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24**

-----------------------------------

ජාතික තරුණ සේවා සභාවෙන් ලැබිය යුතු රු. 47,022,904 ක ණය ශේෂය පිළිබඳව සහ සභාවෙහි භූමිය හා අනෙකුත් සම්පත් උපයෝගී කරගෙන කිසිදු ගාස්තු ගෙවීමකින් තොරව, සමාගමෙහි පරිපාලන හා ව්‍යාපාරික කටයුතු සිදු කිරීම යනාදී සම්බන්ධිත පාර්ශව ගනුදෙනු, පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 මාර්තු 31 දිනට බැංකු ගිණුමක වූ රු. 1,951,513 ක අයිරාව එම වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශනවල වැරදි ලෙස හර ශේෂයක් වශයෙන් දක්වා තිබීම නිවැරදි කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී ජර්නල් සටහනක් මගින් රු. 3,903,026 ක් එම බැංකු ගිණුමට බැරකර ප්‍රවර්තන වර්ෂයේ ආදායම් ප්‍රකාශයට හර කර තිබුණි. මේ අනුව, සමාලෝචිත වර්ෂයේ ලාභය රු. 3,903,026 කින් අඩුවෙන් ගණනය වී තිබුණි.

(ආ) පසුගිය වර්ෂ 04 ක කාල පරිච්ඡේදය තුළ සමාගම විසින් ආරක්ෂක හා පවිත්‍රතා සේවාවන්ට අදාළව රු. 641,853,060 ක ඉන්වොයිස් වටිනාකමක් ගිණුම්ගත කර තිබුණද අදාල සේවාලාභී ආයතනවලින් සත්‍ය වශයෙන් ගෙවීමට එකඟව තිබූ වටිනාකම රු. 616,616,929 ක් වූයෙන් ණයගැති වටිනාකම රු. 25,236,131 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ආරක්ෂක හා පවිත්‍රතා සේවාවන්වලට අදාළ ආදායම රු. 1,723,657 ක් වැඩියෙන් සහ පූර්ව වර්ෂයට අදාළ රු. 1,026,041 ක් වූ ආදායම් ප්‍රවර්තන වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 2,749,698 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාගමේ සේවකයින් වෙනුවෙන් පාරිතෝෂික වෙන් කිරීම් සිදුකර නොතිබුණි.

**2.2.3** පැහැදිලි නොකළ වෙනස්කම්

සමාගම විසින් ලබාදුන් තොරතුරු අනුව, ජාතික තරුණ සේවා සභාව වෙතින් 2016 මාර්තු 31 දිනට අයවිය යුතු ණය ශේෂය රු. 45,148,216 ක් වුවත් සභාවෙහි මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු. 305,790 ක් වූයෙන් රු. 44,842,426 ක හඳුනා නොගත් වෙනසක් විය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ 04 කට අධික කාලයක සිට පැවත එන රු. 532,581 ක ලැබිය යුතු වැට් බදු හා රු. 2,172,555 ක ගෙවිය යුතු වැට් බදු මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් පැවතුණි. සමාගම විසින් වැට් බදු සඳහා ලියාපදිංචි වී නොතිබුණු බැවින් ඉහත සඳහන් පරිදි ශේෂයන් පැවතීම අසාමාන්‍ය වුවත් එම ශේෂ නිරවුල් කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) එකතුව රු. 98,155,014 ක් වූ ණයගැති ශේෂවලින් සියයට 36 ක් වර්ෂයකට අධික කාලපරිච්ඡේදයකට අයත් වූ අතර වර්ෂ 3 ඉක්මවූ ණය ශේෂවල වටිනාකම රු. 8,400,908 ක් විය. තවද නිශ්චිතව අය නොවන ණය ශේෂ හඳුනාගෙන අඩමාන ණය වෙන්කිරීමට ද කටයුතු කර නොතිබුණි.

## 2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නිලධාරීන් 16 දෙනෙකුට අදාළ පෞද්ගලික ලිපිගොනු විගණනයට ඉල්ලා සිටිය ද එම ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොවූ බැවින් තනතුරට අදාළ සුදුසුකම් සපුරා තිබේද යන්න හා එම නිලධාරීන් වෙත ප්‍රමාණවත් රාජකාරී පැවරීමක් සිදුකර තිබේද යන්න පරීක්ෂා කළ නොහැකි විය.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇති රු. 1,134,335 ක් වූ ආදායම් බදු වට්නාකමෙහි නිවැරදි බව තහවුරු කර ගැනීම සඳහා ඊට අදාළ ගණනය කිරීම් විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 66 වන වගන්තිය | සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු ලෙස පත්වීමට අවම වශයෙන් කොටස් 100 ක් හෝ මිලදීගෙන තිබිය යුතු වුවද සමාගමෙහි දැනට සිටින අධ්‍යක්ෂවරුන් විසින් කොටස් මිලදීගෙන නොතිබුණි. |
| (ආ) | 2007 අංක 07 දරන සමාගම් පනතේ 133 වගන්තිය | ලිත් වර්ෂයකට වරක් සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීමක් පැවැත්විය යුතු වුවද 2015 වර්ෂයට අදාළව, මහා සභා රැස්වීම පවත්වා නොතිබුණි. තවද, අවසන් වරට මහා සභා රැස්වීම් පවත්වන ලද දිනය හා වාර්තාව විගණනය සඳහා ඉදිරිපත් නොකළ බැවින් පෙර වර්ෂවලට අදාළ තොරතුරු අනාවරණය නොවුණි. |
| (ඇ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත | 2016 මාර්තු 31 වන දිනට සමාගමේ සේවයේ නියුතු මුළු කාර්ය මණ්ඩලය 767 ක් වූ අතර එම සේවකයින් වෙනුවෙන් වාර්ෂිකව පාරිතෝෂික වෙන් කිරීමක් සිදු කර නොතිබුණි. කෙසේ වුවද, ස්ථිර කාර්ය මණ්ඩලයේ සේවකයින් 41 ක් දෙනා වෙනුවෙන් පමණක් 2016 මාර්තු 31 දින වන විට එලෙස වෙන් කළ යුතු පාරිතෝෂික මුදල්වල එකතුව රු. 13,794,177 ක් විය. |
| (ඈ) | 1985 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත<br>(i) 10 (1) හා 15 වගන්ති | 2015 ඔක්තෝබර් සිට 2016 මාර්තු දක්වා වන මාස 06 ක කාලය තුළ ආයතනයේ සේවයේ නියුක්තව සිටි සේවකයන්ගෙන් සියයට 11 කට පමණ සේවක අර්ථ සාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් සඳහා දායක මුදල් ගෙවා නොතිබුණි. |

| | |
|---|---|
| (ii) 47 වගන්තිය හා 49 වගන්තිය | සේවක අර්ථ සාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් දායකය ගණනය කිරීමේදී අන්තර් දීමනා හා විශේෂ දීමනා හැර අනෙකුත් ඉපයීම් අදාළ කර ගත යුතු බව දක්වා තිබුණද, සමාගම විසින් සේවකයන්ගේ මූලික වැටුප නොසලකා, ආරක්ෂක සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් තීරණය කරන අවම මාසික වේතනයට පමණක් දායක මුදල් ගණනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයට අදාළව දායක මුදල් රු. 8,509,233 ක් අඩුවෙන් ප්‍රේෂණය කර තිබුණි. |
| (ඉ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 1 වන පරිච්ඡේදයේ 2 වන වගන්තියේ (අ) උප වගන්තිය හා 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 2 වන වගන්තියේ (ඇ) උප වගන්තිය | සේවා සපයන ආයතනයක් වන සමාගම විසින් එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු පනත්වල දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව අදාළ බදු මුදල් ගෙවීම සඳහා ලියාපදිංචි වීමක් හෝ ඉන් නිදහස් වීමක් නිරීක්ෂණය නොවුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු. 10,135,082 ක ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු. 19,270,251 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය සියයට 47 කින් හෙවත් රු. 9,135,169 කින් පිරිහී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව ආදායමෙහි වැඩිවීම රු. 126,600 ක් වැනි අඩු අගයක් ගෙන තිබුණද වියදම රු. 15,510,999 කින් වැඩිවී තිබීම ඉහත පිරිහීමට සෘජු ලෙස බලපා තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රකාශන අනුව, ශුද්ධ ලාභයක් පෙන්නුම් කර තිබුණ ද මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව ශුද්ධ මුදල් ප්‍රවාහය රු. 4,583,276 ක සෘණ ශේෂයක් වී තිබුණි. ණය ගැති ශේෂය රු. 15,769,847 කින් වැඩිවීම මෙම තත්ත්වයට සෘජුලෙස බලපා තිබුණි. සමාගමෙහි ජංගම වත්කම් හා ජංගම බැරකම් අනුපාතය 3:1 ක් ලෙස පෙන්නුම් කර තිබුණ ද බැංකු අයිරා ශේෂය ජංගම වගකීම්වලින් සියයට 19 ක් නියෝජනය වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 98,155,014 ක් වූ ණයගැති ශේෂය මුළු ජංගම වත්කම් වටිනාකමින් සියයට 90 ක් නියෝජනය වී තිබුණි. තවද, සමාගමෙහි ස්ථාවර වත්කම් ප්‍රමාණය මුළු වත්කම් වටිනාකමින් සියයට 0.86 ක් පමණ ඉතාමත් අඩු ප්‍රතිශතයක් ගෙන තිබුණි.

ආයතනයේ ද්‍රවශීලතා අනුපාත විශ්ලේෂණය කිරීමේදී ක්ෂණික අනුපාතය 2:6 ක් ලෙස පෙන්නුම් කර තිබුණ ද දීර්ඝ කාලීනව අයනොවී පවතින ණයගැති ශේෂ පැවතීම හේතුවෙන් ඉහත තත්ත්වය සතුටුදායක තත්ත්වයක් නොවන බව නිරීක්ෂණය විය. පූර්ව වර්ෂයේ වාර 4 ක් ව පැවති ණයගැති පිරිවැටුම් අනුපාතය සමාලෝචිත වර්ෂය වන විට වාර 3 ක් ලෙස අඩුවී තිබීම හා ආයතනයේ ණය කාල සීමාව දින 30 ක් වුවත් සත්‍ය ණය එකතු කිරීමේ කාලය දින 122 ක් වීමෙන් ඉහත තත්ත්වය තව දුරටත් සනාථ වන බව නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කාර්යසාධනය

---------------

සාංගමික සංස්ථා පත්‍රයට අනුව, සමාගමට විවිධ ක්ෂේත්‍ර 56 ක් යටතේ තම සේවාවන් පුළුල් කර ව්‍යාපාරික කටයුතු කිරීමට හැකියාව ඇතත්, සමාගම ආරම්භ කර වර්ෂ 35 ක් ඉක්ම ගොස් තිබුණ ද මුද්‍රණාලය, ආපන ශාලාව, පවිත්‍රතා සහ ආරක්ෂක යන ක්ෂේත්‍ර 4 ක් සඳහා පමණක් තම ව්‍යාපාරික කටයුතු සීමාකර තිබුණි. එම ව්‍යාපාරික කටයුතු ද ප්‍රවර්ධනය කිරීම සඳහා සැලසුම්ගත ඉදිරි වැඩ පිළිවෙලක් සමාගම සතුව නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළව සමාගම වෙත යොමු කරන ලද විගණන විමසුම් 19 කට පිළිතුරු එවා නොතිබුණු අතර ප්‍රමාද වූ කාලය දින 15 සිට දින 361 ක පරාසයක විහිදී තිබුණි.

(ආ) සමාගමෙහි විවිධ කටයුතු සඳහා අත්තිකාරම් ගෙවීමට සීමාවක් නොතිබුණු අතර වාර්තා තබාගැනීම විධිමත් පරිදි සිදුවී නොතිබුණි. තවද එක් අත්තිකාරමක් ලබාදී එය පියවීමෙන් පසු අනෙක් අත්තිකාරම ලබා දීමත්, අත්තිකාරම පියවීම සඳහා දින 7 ක කාලයක් ලබා දීමත් සමාගමේ ප්‍රතිපත්තිය වුවත් ඉන් පරිබාහිරව අත්තිකාරම් ලබාදී තිබුණි. ආපන ශාලාවේ පුහුණු ලිපිකරුවකු ලෙස සේවය කරන නිලධාරිනියකට අවස්ථා තුනකදී ලබාදී තිබූ එකතුව රු. 152,739 ක අත්තිකාරම පියවා නොතිබීම හා විගණන දිනය වූ 2015 මැයි 08 දිනට එය දින 150 ක් දක්වා ප්‍රමාද කර තිබීම නිදසුනක් ලෙස නිරීක්ෂණය විය.

### 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම විසින් සමාලෝචිත වර්ෂයේ මුද්‍රණාලය, ආපන ශාලාව, පවිත්‍රතා සහ ආරක්ෂක සේවා සැපයීම යන ව්‍යාපාරික කටයුතු සිදුකර තිබුණු අතර මුද්‍රණාලයෙහි සහ ආපන ශාලාවෙහි මෙහෙයුම් සම්බන්ධයෙන් වූ නියැදි විගණන පරීක්ෂණවල දී අනාවරණය වූ කරුණු පහත සඳහන් වේ.

(i) දහසය දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් සහිත මුද්‍රණාලයෙහි 2015 වර්ෂයේ සමස්ත ආදායම රු. 13,682,281 ක් වූ අතර වියදම රු. 15,552,247 ක් වූයෙන් රු. 1,869,966 ක අලාභයක් පෙන්නුම් කර තිබුණි. මෙම අලාභය කෙරෙහි, ව්‍යාපාරික කටයුත්ත සඳහා යොදවා තිබූ කාර්ය මණ්ඩලය වෙත විධිමත් රාජකාරි පැවරීමක් හා ප්‍රමාණවත් වැඩබෙදීමක් සිදු කර නොතිබීම, එක් අයකුගේ කාර්යභාරය ඉහළ නිලධාරියකුගේ අධීක්ෂණයට හා පාලනයට යටත්වන පරිදි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් නොතිබීම, නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ගබඩාවට ලබා ගැනීම සහ නිකුත් කිරීම පිළිබඳ විධිමත් ලේඛන නඩත්තු කර නිසි අධීක්ෂණයක් යටතේ සිදුකර නොතිබීම වැනි හේතු සෘජු ලෙස බලපා තිබුණි.

(ii) ජාතික තරුණ සේවා සභා පරිශ්‍රය තුළ පවත්වාගෙන යනු ලබන ආපනශාලා 2 හි සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 39,895,120 ක් හා වියදම රු. 39,632,749 ක් වූ බැවින් ලාභය රු. 262,371 ක් වී තිබුණි. කළමනාකරු ඇතුළුව 20 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් එහි සේවය කරන අතර 2016 වර්ෂයේදී මුළු වියදමින් සියයට 25 ක් එනම් රු. 9,713,780 ක් එම නිලධාරීන්ට වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. සභාව තුළ තරඟකාරී වෙනත් ආයතනයක් නොමැති බැවින් හා එහි ප්‍රධාන දේශන ශාලාවේ නිරන්තරයෙන් පවත්වන වැඩසටහන් සඳහා දෛනිකව බාහිර පුද්ගලයින් විශාල ප්‍රමාණයක් පැමිණෙන බැවින්, ව්‍යාපාරික කටයුතු සඳහා හිතකර වාතාවරණයක් පැවතුණි. එහෙත් කළමණාකරණය විසින් එම අවස්ථාව උපයෝගී කර නොගෙන අඩු ලාභයක් උපයමින් ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන ගොස් තිබූ අතර පහත සඳහන් මෙහෙයුම් අකාර්යක්ෂමතා ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

* ආපන ශාලාවට අදාළ මිලදී ගැනීම්, අත්තිකාරම් ගෙවීම් හා පියවීම්, විකුණුම්, ආදායම් එක්රැස් කිරීම, බැංකුගත කිරීම් යනාදිය විධිමත් අභ්‍යන්තර පාලනයක් මත සිදුවී නොතිබීම.

* කාර්ය මණ්ඩලය සඳහා වැඩ බෙදීමක් හා විධිමත් රාජකාරී පැවරීමක් සිදුකර නොතිබුණු බැවින් කාර්ය මණ්ඩලය උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව සේවයේ යොදවා නොතිබීම.

* ආපන ශාලාවට අවශ්‍යවන ආහාර හා සියලුම බේකරි නිෂ්පාදන අභ්‍යන්තරව නිෂ්පාදනය නොකර බාහිරින් මිලදී ගැනීම.

(ආ) සමාගම විසින් නිසි මූල්‍ය කළමණාකාරිත්වයක් පවත්වාගෙන ගොස් නොතිබීම මත කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ඉහළ පොළියක් යටතේ බැංකු අයිරා පහසුකම් ලබාගෙන තිබුණු අතර 2016 මාර්තු 31 දිනට බැංකු අයිරාවේ වටිනාකම රු. 297,288 ක් විය.

**4.4 වෙනත් ආයතන වෙත ලබා දුන් සමාගමේ සම්පත්**

-------------------------------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදය ප්‍රකාරව, රාජ්‍ය ව්‍යාපාර සතු සම්පත් වෙනත් රාජ්‍ය ආයතනවල පරිහරණය සඳහා යෙදවීමට අවසර ලබා දී නොමැති වුවද, සමාගමේ සේවකයෙකු වැටුප් ප්‍රතිපූරණය කිරීමේ පදනම මත ජාතික තරුණ සේවා සභාවේ ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය වෙත අනුයුක්ත කර තිබුණි. 2016 මාර්තු 31 දින වන විට සමාගම විසින් එම නිලධාරියාට වැටුප් හා වේතන ලෙස එකතුව රු. 1,447,592 ක් ගෙවා තිබුණු නමුත් සභාව විසින් එම මුදල ප්‍රතිපූරණය කර නොතිබුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, සමාගමේ අනුමත සේවක සංඛ්‍යාව 84 ක් වූ අතර ඉන් තනතුරු 16 කට අදාළ පුරප්පාඩු 22 ක් ද තනතුරු 07 ක් සඳහා අතිරික්ත නිලධාරීන් සංඛ්‍යාව 12 ක් ද විය. අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූ තනතුරු 04 ක් සඳහා අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුකූල නොවන ලෙස නිලධාරීන් 4 දෙනෙකු බඳවාගෙන තිබූ අතර එම නිලධාරීන් එම තනතුරු වලට අදාළ මූලික සුදුසුකම්වත් සම්පූර්ණ කර නොතිබුණි.

(ආ) නියැදි පරීක්ෂණයට අනුව, නිලධාරීන් 13 දෙනෙකුගෙන් 07 දෙනෙකුට විධිමත් රාජකාරි පැවරීමක් සිදුකර නොතිබුණි.

(ඇ) මාස 06 ක කාල සීමාවක් සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගන්නා ලද නිලධාරීන් 06 දෙනෙකුගේ කොන්ත්‍රාත් කාලය විගණන දිනය වූ 2016 අප්‍රේල් 30 වන විට අවසන් වී තිබූ නමුත් ඔවුන්ගේ සේවා ගිවිසුම බණ්ඩනය කර නැවත ගිවිසුමකට එළඹීමෙන් තොරව අඛණ්ඩව සේවය කිරීමට ඉඩ දී තිබුණි.

(ඈ) නව බඳවාගැනීම් සිදුකිරීමේ දී හා තනතුරු සඳහා පුරප්පාඩු පිරවීමේ දී අනුමත බඳවාගැනීමේ පරිපාටියේ ඇතුළත් වැටුප්තලවල නිලධාරීන් පිහිටුවිය යුතු වුවත් එකම තනතුර සඳහා බඳවාගත් නිළධාරීන්ට විවිධ වැටුප්තලවල පිහිටුවා ඒ අනුව වැටුප් ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
-----------------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 150 වගන්තිය ප්‍රකාරව, මූල්‍ය වර්ෂයක් අවසන්වී ඊළඟ මූල්‍ය වර්ෂයේ මාස 06 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත්, 2016 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා වන සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2017 පෙබරවාරි 27, දින 149 ක ප්‍රමාදයකින් පසුව ඉදිරිපත් කර තිබුණි.

### 5.2 සංයුක්ත සැලැස්ම
-------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන චක්‍රලේඛයේ 5.1 ප්‍රකාරව සමාගම සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 5.3 ක්‍රියාකාරී සැලැස්ම
--------------------

2014 පෙබරවාරි 17 දිනැති 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාගම විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබුණි.

### 5.4 අභ්‍යන්තර විගණනය
-----------------------

සමාගමෙහි අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපනය කර නොතිබුණු අතර 2014 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණනයක් සිදුකිරීමට හැකි බව ජාතික තරුණ සේවා සභාව විසින්, 2013 දෙසැම්බර් 03 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට දන්වා තිබුණත්, සමාගමේ කටයුතු ජාතික තරුණ සේවා සභාවේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් හෝ සිදුකර නොතිබුණි.

### 5.5 අයවැය ලේඛනමය පාලනය
-----------------------------

2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 ප්‍රකාරව වාර්ෂික අයවැය ඇස්තමේන්තුවක් සකස්කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) අයවැය පාලනය | සමාගමෙහි කාර්යසාධනය, සැලසුම් හා ඉලක්කයන්ට අනුකූල වන පරිදි වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම හා ඊට අනුකූල වන පරිදි කටයුතු නොකිරීම. |
| (ආ) ගිණුම්කරණය | සමාගම මගින් පවත්වාගෙන යනු ලබන සියළුම ව්‍යාපාරික කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය වෙන් වෙන්ව හා සමස්ත මූල්‍ය ප්‍රතිඵලය දැක්වෙන පරිදි ප්‍රමාණවත් ලේඛන හා මූල්‍ය වාර්තා පවත්වා නොගැනීම. |
| (ඇ) මානව සම්පත් කළමනාකරණය | එක් නිලධාරියකුගේ කටයුතු තවත් නිලධාරියකුගේ අධීක්ෂණයට ලක්වන පරිදි හා තම රාජකාරි කටයුතු සම්බන්ධයෙන් වගකීම නිශ්චය වන පරිදි වැඩ බෙදීමක් හා ලිඛිත රාජකාරි පැවරීමක් සිදු කර නොතිබීම. |
| (ඈ) මිලදී ගැනීම් පාලනය | මිලදීගැනීම් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල වන පරිදි කටයුතු නොකිරීම හා වාර්තා ප්‍රමාණවත් පරිදි පවත්වා නොගැනීම. |
| (ඉ) ගබඩා පාලනය | භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම් නිසි පරිදි සටහන් වන පරිදි හා භාණ්ඩවල ආරක්ෂාව තහවුරු වන පරිදි ප්‍රමාණවත් පාලන ක්‍රම ගබඩා සම්බන්ධයෙන් පවත්වා නොගැනීම. |
| (ඊ) ණයහිමි හා ණයගැති පාලනය | ණය හිමියන් හා ණය ගැතියන් පිළිබඳ නිවැරදි තොරතුරු වාර්තා කිරීම සහ කල් ඉකුත්වූ ශේෂ නිරවුල් කිරීම සඳහා කටයුතු නොකිරීම. |